ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**<u>පුවත්පත් නිවේදනය</u>**

# දමිළ පාර්ලිමේන්තු මන්ත්‍රී නියෝජිත පිරිසක් අවුරුදු සුබ පැතුම් රැගෙන මහ කොමසාරිස්තුමා හමු වේ

TELO සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී සෙල්වම් අඩෛයිකලනාදන් මහතා, TELO සාමාජික, පාර්ලිමේන්තු මන්ත්‍රී ජී. කරුණාකරන් මහතා, PLOTE සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ඩී. සිද්ධාර්ථන් මහතා, EPRLF සභාපති සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා, TELO මාධ්‍ය ප්‍රකාශක ජී. සුරේන්තිරන් මහතා සහ DCP සභාපති වෙන්තන් මහතා අවුරුදු සුබ පැතුම් පිරිනැමීම සඳහා මහ කොමසාරිස්තුමා හමු වූ අතර එහිදී ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය සාකච්ඡා කෙරිණ.

2. නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ දමිළ ජනතාවගේ අභිලාෂයන් සහ ඒ සම්බන්ධ කරුණුවල ප්‍රගතිය පිළිබඳව මහ කොමසාරිස්තුමා දැනුවත් කළහ.

3. මහ කොමසාරිස්තුමා එම නියෝජිත පිරිස වෙත අලුත් අවුරුද්ද සඳහා සුබ පැතුම් පිරිනැමූ අතර 13වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම උදෙසා ඉන්දියාවේ කැපවීම අවධාරණය කළේය.

***

කොළඹ
2023 අප්‍රේල් 28